# සාමාන්‍ය සමයේ විසිහයවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම නෙහෙමියා 8 : 1-12

නෙහෙමියාගේ කතාවෙන් ගත් පාඨයෙකි.

"එස්රා නම් පූජකයා ව්‍යවස්ථා පොත සෙනඟ ඉදිරියේ කියෙව්වේ ය."

හත්වන මස පළමුවන දවස පැමිණි කල ඉශ්‍රායෙල් සෙනඟ තමන්ගේ නගරවල සිටියෝ ය. එවිට ඔව්හු සමිඳාණන් වහන්සේ විසින් ඉශ්‍රායෙල්වරුන්ට අණ කරන ලද මෝසෙස්ගේ ව්‍යවස්ථා පොත ගෙනෙන්ට නීතිවේදියා සහ පූජකයා වන එස්රාට කීහ. පූජකයා වන එස්රා ද හත්වන මාසයේ පළමුවන දා සභාව එනම්, පුරුෂයන් ද ස්ත්‍රීන් ද තේරුම් ගන්නට පුළුවන් වයසට පැමිණි දරු දැරියන් ද ඉදිරිපිට ව්‍යවස්ථා පොත ගෙනවුත්, උදක ද්වාරය ඉදිරියේ තිබුණු චතුරශ්‍රය ඉදිරිපිට ස්ත්‍රී පුරුෂයන් ද තේරුම්ගත හැකි වයසට පැමිණි දරු දැරියන් ද ඉදිරියේ දී අලුයම් වේලේ පටන් ඉර මුදුන් වේලාව දක්වා ඒ පොත කියෙව්වේ ය. මුළු සෙනඟ ද ව්‍යවස්ථා පොතට සවන් දුන්හ.

ව්‍යවස්ථා පොත කියවීම පිණිස සාදන ලද වේදිකාවක් පිට නීතිවේදියා වන එස්රා සිටියේ ය. ඔහු ළඟ ඔහුගේ දකුණු පැත්තෙන් මත්තියා ද ෂෙමා ද අනායා ද ඌරියා ද හිල්කියා ද මයසේයා ද, වම් පැත්තෙන් පෙදායා ද මිෂායෙල් ද මල්කියා ද හාෂුම් ද හෂ්බද්දානා ද ශෙකරියා ද මෙෂුල්ලාම් ද සිටියෝ ය.

මුළු සෙනඟට වඩා උස් තැනක සිටි එස්රා මුළු සෙනඟ ඉදිරියෙහි පොත දිග ඇරියේය. ඔහු එය දිග හරින විට සෙනඟ සියලු දෙන නැගිට සිටියෝ ය. එස්රා අති උත්තම දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කළේය. මුළු

සෙනඟ ද අත් ඔසවමින්, ‘එසේම වේවා’ කියා හිස් නමා මුණින්තලා වී සමිඳාණන් වහන්සේට නමස්කාර කළෝය.

තවද, ජේෂුවා ද බානී ද ෂෙරෙබියා ද ජාමින් ද අක්කුබ් ද ෂබ්බෙතයි ද හෝදියා ද මයසේයා ද කෙලිටා ද අශරියා ද ජොශාබාද් ද හානාන් ද පෙලායා ද යන ලෙවීවරු ද සෙනඟ ඔවුන් සිටි තැන්වල නැවතී සිටියදී ම ඔවුන්ට ව්‍යවස්ථාව තේරුම් කර දුන්හ. මෙසේ ඔව්හු දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථා පොත පැහැදිලි ලෙස කියවා එහි අර්ථය තෝරා ද න්හ. මිනිස්සු ද කියෙවූ දේ තේරුම් ගත්හ.

තිර්ෂාතා වූ නෙහෙමියා ද නීතිවේදියා වූ පූජක එස්රා ද සෙනඟට ඉගැන්වූ ලෙවීවරු ද මුළු සෙනඟට කතා කොට ‘අද දින ඔබ හැමගේ දෙවි සමිඳාණන් වහන්සේට ශුද්ධ දිනයක් ය. වැළපෙන්නට වත් අඬන්නට වත් එපා ය’යි කීහ. එසේ කීවේ, මුළු සෙනඟ ව්‍යවස්ථාවේ වචන ඇසූ කල ඇඬූ බැවිනි. එවිට ඔහු ඔවුන්ට කතා කොට, “ඔබ ගොස් රසවත් දේවල් කා, මිහිරි පානය බී, කිසිවක් සූදානම් කර නොගත් අයට ආහාර පංගු යවන්න. කුමක් නිසාද අද දින අපේ සමිඳාණන් වහන්සේට ශුද්ධ දිනයකි. ශෝක නොවන්න. මන්ද, සමිඳාණන් වහන්සේ කෙරෙහි ප්‍රීති වීම ඔබේ ශක්තිය වේ ය”යි කීය. ලෙවීවරු ද කතා කරමින්, “අද දවස ශුද්ධ දිනයක් නිසා නිශ්ශබ්ද වන්න. ශෝක නොවන්නැ”යි මුළු සෙනඟ නිශ්චල කළෝය. එසේ සෙනඟ සියලු දෙන කන්නටත් බොන්නටත්, කෑම පංගු යවන්නටත්, බොහෝ සේ ප්‍රීති වන්නටත් පිටත් වී ගියෝය. කුමක් නිසා ද ඔවුන් ප්‍රකාශ කළ වචන ඔව්හු තේරුම් ගත්තෝ ය.

දේව වචනය මෙසේ ය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 19: 7-10

පිළිතුර: සමිඳුන්ගේ අණ පණත් සිතට සතුට වඩන්නේ ය.

ගීය:

සමිඳුන්ගේ ව්‍යවස්ථාව පරිසමාප්ත ය. ජීවිතය පණ ගන්වන්නේ ය. සමිඳුන්ගේ නීතිය සත්‍යවාදී ය. අනුවණයන්ට නුවණ දෙන්නේය. සමිඳුන්ගේ අණ පණත් සාධාරණ ය. සිතට සතුට වඩන්නේ ය.

සමිඳුන්ගේ අණසක පැහැදිලි ය. දෙනෙතට එළිය දෙන්නේ ය. සමිඳුන්ගේ කෙරෙහි ගරු බිය නිර්මල ය. එය සදහට ම පවතින්නේ ය. සමිඳුන්ගේ විනිශ්චය යුක්ති සහගත ය.
මුළුමනින් දැහැමි වේ ම ය.

රනට වඩා, පෙරූ රනට වඩා, එය මනහර ය. පැණියට වඩා, මී පැණියට වඩා එය සුමිහිරි ය.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව,
දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය”යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
“දේව රාජ්‍යය ආසන්න ය.
මනස්ථාපනය වී සුබ අස්න අදහා ගන්නැ”යි ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 10: 1-12

"ඔබගේ සාම පැතුම ඔහු පිට රැඳෙනු ඇත."

ජේසුස් ස්වාමින් වහන්සේ තවත් සැත්තෑ දෙනෙකු පත් කොට තමන් යන්නට අදහස් කළ සියලු නගර හා පෙදෙස්වලට ඔවුන් දෙදෙනා බැගින් තමන්ට කලින් යැවූ සේක. උන්වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක. "ගොයම නම් බහුල ය. ගොවීහු විරල ය. එබැවින් ගොයම් කැපීමට මෙහෙකරුවන් එවන මෙන් ගොයමේ හිමියාණන්ට යාච්ඤා කරන්න. ඉතින් යන්න. වග වලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ යවමි. පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ නොගෙන යන්න. මග දී ආචාර කිරීම සඳහා පමා නොවන්න. ඔබ යම් ගෙදරකට ඇතුළු වූ කල, පළමුකොට "මේ ගෙදරට සාමය වේවා!" යි පතන්න. සාමය ලබන්නට සුදුසු කෙනෙක් එහි සිටිත් නම් ඔබගේ සාම පැතුම ඔහු පිට රැඳෙනු ඇත. නැතහොත් එය ඔබ වෙත පෙරළා එනු ඇත. ඔවුන් දෙන දෙය කමින් බොමින් ඒ ගෙදර ම නැවතී සිටින්න. මන්ද, මෙහෙකරුවා සිය වේතනය ලැබිය යුතුය. ගෙදරින් ගෙදරට නොයන්න. ඔබ යම් නුවරකට ඇතුළු වූ කල ඔවුන් ඔබ පිළිගත්තොත් ඔබ ඉදිරියෙහි තබන දේ වළඳන්න. එහි සිටින රෝගීන් සුව කරන්න. 'දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ වෙත පැමිණියේ ය' යි ඔවුන්ට ප්‍රකාශ කරන්න. එහෙත් යම් නුවරකට ඇතුළු වූ කල ඔවුන් ඔබ නොපිළිගත්තොත්, ඒ නුවර වීදිවලට ගොස් "අපේ පාදවල වැකුණු මේ නුවර දූවිලි පවා ඔබට විරුද්ධව අපි ගසා දමමු. ඒ කෙසේ වුවත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ළංව ඇති බව දැන ගන්නැ"යි කියන්න. මෙය මම ඔබට කියමි. ඒ දවසේ දී ඒ නුවරට වඩා සොදොමට සහනය ඇති වන්නේ ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.